# උම්බලගේ කතාව




උසෙලි දම්සි රාජපක්ෂ

# උම්බලගේ කතාව

පළවන මුද්‍රණය 2025 ජනවාරි

කතාව සහ චිත්‍ර

**උසෙලි දම්සි රාජපක්ෂ**

මහාමායා බාලිකා විදුහල

ISBN 978-624-208-280-6

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි
ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද
සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ
නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය
අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන්
ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ
පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල්
පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට
සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ
සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන
අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත
යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන්
ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන
**"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ
සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට
නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට
අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්
ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව
හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස
එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත
දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පිදුම

මා හට අදහස් දෙමින් උදව් කළ

අම්මාටත්, තාත්තාටත්, මල්ලිටත්

හරි වැරදි පෙන්වා උදව් කළ ත්‍යාගි

කාරියවසම් ගුරු මෑණියන්ටත්,

ආදරයෙන් පුදමි.

# උම්බල යෝධයා

ඔන්න එකමත් එක කාලයක යෝධයෙක් හිටියා. එයාගේ නම උම්බල. මේ යෝධයා ජීවත් වුණේ උම්බලකඩ විකුණලා. මෙයා හරිම කරුණාවන්තයි. එයා සතියකට සැරයක් හෝ වැවට ගිහිල්ලා මාලු අල්ලගෙන ඒවා වේලලා උම්බලකඩ හදනවා. හැබැයි එයා මාලු ඇල්ලුවෙත් කැමැත්තකින් නෙවෙයි.


ඒ මගේ
ඔයා ඕච්චර මහත ඇයි ?

**මේ** යෝධයා හොඳ කෙනෙක් නිසා එයා දිහා සුරංගනාවියක් බලාගෙන හිටියා. ඉතින් මේ සුරංගනාවි යෝධයාට තෑග්ගක් දෙන්න හිතුවා. මේ කරුණාවන්ත යෝධයා උම්බලකඩ විකිණුවාට ඒවාට කියන්නේ *උම්බලකඩ* කියලා දැනගෙන හිටියේ නෑ.



**සු**රංගනාවි උම්බලගේ ගෙදරට ගිහිල්ලා මෙහෙම කිවුවා "හෙට කැලෑවෙ පැවැත්වෙන රැස්වීමට එන්න ඕන" යෝධයා "හා මම එන්නම් " කියලා පිළිගත්තා. එදාට එයාට ගොඩක් වැඩ තිබුණත් සුරංගනාවි කිවුව නිසා රැස්වීමට යන්න එයා කැමති වුණා. සුරංගනාවී අනිත් කැලෑ යාලුවන්ටත් රැස්වීමට එන්න කිවුවා. රැස්වීම තියෙන දවසත්



දන්නෙම නැතුව උදා වුණා. යෝධයා එයාගේ හොඳම ඇඳුම ඇඳගෙන රැස්වීමට යන්න සූදානම් වුණා.

ඔන්න! සුරංගනාවී යෝධයාට වේදිකාවට එන්න කියලා කතා කළා සුරංගනාවි ලොකු මල්ලක් දිලා ඒක යෝධයාට ඇරලා බලන්න කිවුවා. යෝධයා ඒක ඇරලා බැලුවා.



මොනවා!

ඒක අස්සේ තිබුණේ.......

●●● පුලුවන් නම් කියන්න●●●

**ඒ**ක අස්සේ තිබුණේ උම්බලකඩ ගොඩක්.

යෝධයාට පුදුම

හිතුණා.

.සුරංගනාවීට

දැනුණා යෝධයා

පුදුම වෙලා කියලා.



**යෝ**ධයා ඇහුවා “ ඇයි මට මේවා. මට

තියෙනවනෙ මේවා” කියලා.

සුරංගනාවි කිවුවා “ඇයි අනේ මට මේවා

මවන්න පුලුවන්නෙ”කියලා.

“ආ! ” යෝධයාට කියවුණා. ඉතින් ඊට පස්සේ

සුරංගනාවි කිවුවා, “ මේවාට කියන්නේ

උම්බලකඩ කියලා.”


අයියෝ! මට මේවා මවන්න පුළුවන්නේ.
මට මොකාටද ඕවා! බය පනිනේ!

“ඉතින් ඒකෙ මගේ නමත්

තියෙනවනෙ”යෝධයා කිවුවා.

“ඔව්. ඒකෙ ඔයාගේ නමත් තියෙනවා.

මෙහෙමයි, ඔයාගේ නම උම්බල, ඔයා කඩයක්

දානවනේ, ඒ නිසා මේවා උම්බලකඩ

ෂා! නියමයිනේ! උම්බල යෝධයාට කියවුණා.

ඉතින් ඊට පස්සේ උම්බලගේ කඩෙන් සත්තු

යාලුවෝ හැමෝම උම්බලකඩ ගත්තා.

එදායින් පස්සේ උම්බලගේ කඩේට අලුත්

නමක් ලැබුණා. ඒ තමයි.......




●●●● උම්බලගේ උම්බලකඩ●●●●

නිමි●



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණාකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්